# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

⑤

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 10 ශ්‍රේණිය

## ගිණුම්කරණ සමීකරණ

පහත සඳහන් තොරතුරු ඇසුරින් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වලකගේ ව්‍යාපාරයේ ජනවාරි 01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි වේ.

| වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| 150 000 | = | 90 000 | + | 60 000 |

ජනවාරි මාසයේ පළමු සතිය තුළ පහත ගනුදෙනු සිදුව ඇත.

A - රු. 20 000ක භාණ්ඩ අත්පිට මිලට ගැනීම.
B - රු. 25 000ක භාණ්ඩ ණයට ගැනීම.
C - රු.30 000ක පිරිවැය සහිත තොග රු.45 000කට අත්පිට මුදලට විකිණීම.
D - ණයහිමියන්ට ගෙවීම රු.15 000

01. ඉහත ගනුදෙනුවලින් පසුව ව්‍යාපාරයේ මුළු වත්කම් කොපමණද ?

I. රු. 135 000
II. රු.150 000
III. රු. 160 000
IV. රු. 175 000

02. ඉහත ගනුදෙනුවලින් පසුව ව්‍යාපාරයේ මුළු වගකීම් කොපමණද ?

I. රු. 50 000
II. රු.60 000
III. රු. 70 000
IV. රු. 85 000

03. ඉහත ගනුදෙනු අතුරින් මුළු වත්කම්වල අගය වෙනස් නොවන ගනුදෙනුව කුමක්ද?

I. A
II. B
III. C
IV. D

04. ඉහත ගනුදෙනුවලින් පසුව ව්‍යාපාරයේ ලාභය කොපමණද ?

I. රු.5 000
II. රු.10 000
III. රු.15 000
IV. රු.20 000

05. ජනවාරි මාසයේ පළමු සතිය අවසානයේදී ව්‍යාපාරයේ මුළු හිමිකම් කොපමණද ?

I. රු. 100 000
II. රු. 105 000
III. රු. 110 000
IV. රු. 120 000

06. චනුකගේ ව්‍යාපාරය 2021 ජනවාරි මාසයේ පහත තොරතුරු සපයා ඇත.

2021.01.01 දිනට ප්‍රාග්ධනය රු.560 000
ජනවාරි මාසයේ ආදායම් රු. 280 000
ජනවාරි මාසයේ වියදම් රු. 130 000
ජනවාරි මාසය තුළ චනුක යෙදූ මුදල රු. 70 000

ජනවාරි මාසය අවසානයේදී චනුකගේ ව්‍යාපාරයේ හිමිකම කොපමණද ?

I. රු. 540 000
II. රු. 600 000
III. රු. 710 000
IV. රු. 780 000

අංක 07 සිට 10 දක්වා ප්‍රශ්න වලට පහත තොරතුරු උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.

- චාමරගේ ව්‍යාපාරයට අදාළව 2021.01.01 දිනට පැවති සියලු වත්කම් සහ වගකීම් වල ශේෂ පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ලී බඩු | 300 000 |
| භාණ්ඩ තොග | 180 000 |
| ණය හිමියෝ | 50 000 |
| බැංකු ණය | 100 000 |
| මුදල් | 30 000 |
| හිමිකම | 360 000 |

ජනවාරි මාසයේ දී පහත ගනුදෙනු කිහිපයක් සිදුව ඇත.

1. රු.50 000ක භාණ්ඩ තොග ණයට ගැනීම.
2. ගෙවූ ගොඩනැගිලි කුලිය රු.20 000
3. රු.80 000 ක තොග රු.120 000කට අත්පිට විකිණීම

07. ඉහත ගනුදෙනු වලින් පසු ඉතිරි මුදල් ශේෂය වන්නේ

I. රු. 100 000
II. රු. 110 000
III. රු. 120 000
IV. රු. 130 000

08. ඉහත ගනුදෙනු වලින් පසුව ව්‍යාපාරයේ හිමිකම කොපමණද ?

I. රු. 300 000
II. රු. 360 000
III. රු. 350 000
IV. රු. 380 000

09. ඉහත ගනුදෙනු වලින් පසුව ව්‍යාපාරයේ ඉතිරි තොගය කොපමණ ද?

I. රු. 150 000     II. රු. 160 000
III. රු. 180 000     IV. රු. 200 000

10. ඉහත ගනුදෙනු වලින් පසුව ව්‍යාපාරයේ මුළු වත්කම් කොපමණ ද?

(1) රු. 500 000     (2) රු. 580 000
(3) රු. 600 000     (4) රු. 680 000

11. 2021/03/01 දිනට සාගරගේ ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණ පහත දැක්වේ

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| 200 000 | = | 150 000 | + | 50 000 |

- රුපියල් 20 000 ක භාණ්ඩ තොගයක් ණයට ලබාගැනීම.

ඉහත ගනුදෙනුව සැලකිල්ලට ගැනීමෙන් පසුව නිවැරදි සමීකරණය වන්නේ

| | වත්කම් = හිමිකම් + වගකීම් | | වත්කම් = හිමිකම් + වගකීම් |
|---|---|---|---|
| I. | 180 000 = 150 000 + 30 000 | II. | 220 000 = 170 000 + 50 000 |
| III. | 220 000 = 150 000 + 70 000 | IV. | 180 000 = 130 000 + 50 000 |

12. ව්‍යාපාරයක වත්කම් ගිණුම් වල පමණක් ඇතුලත් වන ගනුදෙනු වන්නේ
   I. රු.5 000 භාණ්ඩ තොගයක් ණයට ගැනීම.
   II. රු.60 000 ලී බඩු අයිතිකරු ව්‍යාපාරයට යෙදවීම.
   III. රු 4 000 මුදලක් ණය හිමියන්ට ගෙවීම.
   IV. රු 3 000 ක මුදලක් ණය ගැතියන්ගෙන් ලැබීම.

13. ව්‍යාපාරයක හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුව වන්නේ.
   I. පිරිවැය 2 000ක් වූ භාණ්ඩ රු.1 500ක මුදලට විකිණීම.
   II. රු. 50 000ක ව්‍යාපාරයේ බැංකු ණය අයිතිකරුගේ පුද්ගලික මුදලින් ගෙවීම.
   III. ව්‍යාපාරයේ විදුලිබිල රුපියල් 3 000 ක් ගෙවීම.
   IV. රු. 4 000ක භාණ්ඩ අයිතිකරු විසින් පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙනයාම.

14. ව්‍යාපාරයක හිමිකම අඩුවීමට බලපාන ගනුදෙනුව වන්නේ
   I. ව්‍යාපාරයේ දුරකථන ගාස්තු රු. 6 000 ගෙවීම.
   II. ව්‍යාපාරයට අයිතිකරු රු. 10 000ක් ප්‍රාග්ධනය ලෙස යෙදවීම.
   III. ස්ථාවර තැන්පතු පොලිය රු. 4 000 ක් ලැබීම.
   IV. රු. 80 000ක ලී බඩු මිල දී ගැනීම.

15. 2021.01.01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි වේ.

වත්කම් = හිමිකම් + වගකීම්
30 000 = 20 000+10 000

2021.01.10 දින සිදු කරන ලද ගනුදෙනුවකට පසු ගිණුම්කරණ සමීකරණය පහත පරිදි වේ.

වත්කම් = හිමිකම් + වගකීම්

26 000=19 000+7 000

ඉහත 2021.01.10 දින සිදු වූ ගනුදෙනුව කුමක් ද?

I. රු. 4 000ක පිරිවැය වූ භාණ්ඩ රු. 3 000ට විකිණීම.
II. රු. 1 000 ක මුදල් වට්ටමකට යටත්ව රු. 4 000 ණයගැති ලැබීම
III. රු. 4 000ක බැංකුණය වාරිකය, එහි පොලිය රු. 1 000 සහිතව ගෙවීම.
IV. රු. 1 000ක වට්ටමකට යටත්ව ණයහිමියන්ට රු. 4 000 මුදල් ගෙවීම.

රවිමල්ගේ ව්‍යාපාරයේ 2021/03/01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

වත්කම් = හිමිකම් + වගකීම්

60 000 = 40 000+ 20 000

මාර්තු මාසයේ දී පහත සඳහන් ගනුදෙනු සිදු විය.
(A) ණය හිමියන්ට මුදල් ගෙව්වා රු.6 000 කි
(B) ව්‍යාපාරයේ දුරකථන ගාස්තු ගෙව්වා රු.4 000
(C) පිරිවැය රු.8 000ක් වූ භාණ්ඩ ණයට ගත්තා
(D)පිරිවැය රු.6 000ක් වූ භාණ්ඩ රු.10 000කට මුදලට විකිණීම.

ඉහත තොරතුරු ඇසුරින් පහත 16 17 18 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

16. ඉහත ගනුදෙනු වලින් පසු වගකීම් වල වටිනාකම වනුයේ

I. රු. 22 000
II. රු. 18 000
III. රු. 38 000
IV. රු. 20 000

17. ඉහත ගනුදෙනු වලින් හිමිකම වෙනස්වීමට පමණක් බලපාන ගනුදෙනු වන්නේ

I. A හා C
II. B හා C
III. A හා B
IV. B හා D

18. මාර්තු මාසය අවසාන දිනට ගිණුම්කරණ සමීකරණයේ අගයන් වන්නේ

| | වත්කම් = හිමිකම් + වගකීම් | | වත්කම් = හිමිකම් + වගකීම් |
|---|---|---|---|
| I. | 62 000 = 36 000 + 26 000 | II. | 62 000 = 40 000 + 22 000 |
| III. | 60 000 = 40 000 + 22 000 | IV. | 60 000 = 36 000 + 24 000 |

19. පහත සඳහන් සමීකරණ අතුරින් මූලික ගිණුම්කරණ සමීකරණය තෝරන්න.

I. වත්කම් = හිමිකම් - වගකීම්
II. වගකීම් = හිමිකම් - වත්කම්
III. හිමිකම = වත්කම් + වගකීම්
IV. වත්කම් = වගකීම් + හිමිකම්

20. විදුලි වියදම රු.6 000ක් ගෙවීම නිසා ව්‍යාපාරයක

I. වත්කම් රු.6 000ක් වැඩි වේ. හිමිකම රු.6 000ක් වැඩිවේ.
II. වත්කම් රු.6 000ක් වැඩි වේ. වත්කම් රු. 6 000ක් අඩු වේ.
III. වත්කම් රු. 6 000ක් අඩුවේ. හිමිකම රු.6 000ක් අඩු වේ.
IV. වත්කම් රු. 6 000ක් වැඩි වේ. වගකීම් රු.6 000ක් වැඩි වේ.

21. ජනහිත ව්‍යාපාරයේ ණයගැති ශේෂය රු.70 000ක් විය. මාසය තුළ දී ණයගැතියන්ගෙන් රු.10 000ක වට්ටමකට යටත්ව මුදල් ලැබුණි.

ඉහත ගනුදෙනු මූලික ගිණුම්කරණ සමීකරණයට ගැලපීමේදී නිවැරදි පිළිතුර වන්නේ

I.
වත්කම් = හිමිකම් + වගකීම්
- 70 000 (ණයගැති) - 10 000 (දුන් වට්ටම්)
+ 60 000 (මුදල්)

II.
වත්කම් = හිමිකම් + වගකීම්
+ 60 000 (මුදල්) +10 000 (දුන් වට්ටම්) - 70 000 (ණයහිමි)

III.
වත්කම් = හිමිකම් + වගකීම්
- 60 000 (මුදල්) + 10 000 (ලද වට්ටම්)
+ 70 000 (ණයගැති)

IV.
වත්කම් = හිමිකම් + වගකීම
+ 70 000 (මුදල්) - 10 000 (ලද වට්ටම්) - 60 000 (ණයහිමි)

22. 2021/01/01 දිනට අමල්ගේ ව්‍යාපාරයේ පහත ශේෂ පැවතුණි.

| | |
|---|---|
| මුදල් | රු. 60 000 |
| ණයගැතියෝ | රු. 20 000 |
| ණය හිමියෝ | රු. 30 000 |
| බැංකු ණය | රු.100 000 |
| ඉඩම් ගොඩනැගිලි | රු.200 000 |

අවශ්‍ය වන්නේ 2021/1/1 දිනට හිමිකම ගණනය කරන්න.

23. සුජීවගේ ව්‍යාපාරයේ 2021 වර්ෂය සඳහා තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| ප්‍රාග්ධනය (2021/01/01 දිනට) | රු 300 000 |
| ගැනිලි | රු. 30 000 |
| වර්ෂය තුළ අයිතිකරු ගෙන ආ මුදල් | රු 100 000 |
| වර්ෂයේ වියදම | රු. 60 000 |
| වර්ෂයේ ආදායම | රු. 90 000 |

ඉහත තොරතුරු සැලකිල්ලට ගෙන 2021/12/31 දිනට හිමිකම ගණනය කරන්න.

24. ජයන්තගේ ව්‍යාපාරයේ 2021 ජනවාරි මස සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.
2021/01/01 දිනට පහත ශේෂ පැවතිණි.

| | | | |
|---|---|---|---|
| වත්කම් | - | ලී බඩු උපකරණ | රු 200 000 |
| | | භාණ්ඩ තොගය | රු 100 000 |
| | | මුදල් | රු 60 000 |
| | | ණයගැතියෝ | රු20 000 |
| වගකීම් | - | බැංකු ණය | රු.100 000 |
| | | ණය හිමි | රු50 000 |

ජනවාරි මාසයේ පහත ගනුදෙනු සිදු වී ඇත.

1. අයිතිකරු විසින් රු 80 000ක් ව්‍යාපාරයට යෙදවීම.
2. රු.10 000 ක භාණ්ඩ ණයට ගැනීම.
3. ව්‍යාපාරය විසින් විකිණීමට ඇති භාණ්ඩ වලින් රු.20 000 ක පිරිවැය වූ භාණ්ඩ ජයන්ත පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.
4. රු.8 000 කට මිල දී ගත් භාණ්ඩ තොගයක් රු.15 000 කට මුදලට විකිණීම.
5. රු.100 000ක තවත් බැංකු ණයක් ලබාගැනීම.
6. රු.6 000ක් ණය හිමියන්ට ගෙවීම.

ඉහත ගනුදෙනු වටිනාකම් සහිතව පහත සඳහන් ආකෘතියට සටහන් කරන්න.
පිළිතුරු සැපයීමේ දී අගය වැඩිවේනම් (+) ලකුණ ද අගය අඩු වේ නම් (-) ලකුණ ද යොදන්න .

| අනු අංකය | වත්කම් | | | | හිමිකම | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|
| | ලී බඩු | භාණ්ඩ | මුදල් | ණයගැති | | ණයහිමි | බැංකු ණය |
| 2021.01.01ශේෂය | | | | | | | |
| (1) | | | | | | | |
| (2) | | | | | | | |
| (3) | | | | | | | |
| (4) | | | | | | | |
| (5) | | | | | | | |
| (6) | | | | | | | |

ලකුණු 06

25. පහත දැක්වෙන්නේ ලෙජරයේ පවතින ගිණුම් වර්ග සඳහා උදාහරණ වේ. ඒවා ප්‍රධාන ලෙජර් ගිණුම් වර්ග පහට බෙදා දක්වන්න. ඒ සඳහා පහත වගුව භාවිතා කරන්න.

- මුදල්, ආයෝජන, ආයෝජන ආදායම්, ගැණුම්
- ණයහිමියෝ, විකුණුම්, ගෙනඒමේ කුලී, ප්‍රවාරණය, බැංකු ණය පොළී
- බැංකු ණය, ලද වට්ටම්, දුන් වට්ටම්, බැංකු ගාස්තු, අයිරා පොළී
- ගැනිලි, ප්‍රාග්ධනය, ගෙවල් කුලී, ගෙවල් කුලී ආදායම්
- විදුලිය, ලද ලාභාංශ, සේවක වේතන
- පොළී ලැබීම්, ලීබඩු ක්ෂය, යන්ත්‍ර ක්ෂය වෙන් කිරීම, බොල් ණය
- ණයගැතියෝ, යන්ත්‍ර උපකරණ
- ලීබඩු, ලැබිය යුතු ආයෝජන ආදායම
- උපචිත විදුලිය, උපචිත ණයපොළී, තොගය

| වත්කම් | වියදම් | හිමිකම් | ආදායම | වගකීම් |
|---|---|---|---|---|
| | | | | |

26. ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක බලපෑම ගිණුම්කරණ සමීකරණ ආශ්‍රයෙන් පහත පරිදි දක්වා ඇත.

| දිනය | වත්කම් | = | හිමිකම් | + වගකීම් |
|---|---|---|---|---|
| 5/1 | වැඩිවේ | = | වැඩිවේ | |
| 5/5 | වැඩිවේ | = | | වැඩිවේ |
| 5/8 | අඩුවේ | = | අඩුවේ | |
| 5/10 | අඩුවේ<br>වැඩිවේ | = | වැඩිවේ | |
| 5/15 | වැඩිවේ<br>අඩුවේ | | | |
| 5/18 | අඩුවේ | = | අඩුවේ | අඩුවේ |

ඉහත සඳහන් බලපෑම් ඇතිවීමට වටිනාකම සහිතව සිදුවේ යැයි අපේක්ෂා කළ හැකි ගනුදෙනු දක්වන්න.

27. පහත දැක්වෙන්නේ ජයනිගේ ව්‍යාපාරයේ 2021 මාර්තු මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයකි.

| | |
|---|---|
| මාර්තු 01 | රු.100 000 ක ප්‍රාග්ධනය යෙදීම. |
| මාර්තු 03 | රු.30 000 ක භාණ්ඩ මුදලට ගැනීම. |
| මාර්තු 04 | ව්‍යාපාරයේ විදුලිබිල ගෙවූවා රු. 2 000 කි. |
| මාර්තු 08 | පිරිවැය රු. 12 000 ක් වූ භාණ්ඩ රු.15 000 කට ණයට විකිණීම. |
| මාර්තු 10 | රු. 9 000 ක පොළී ආදායම් ලැබීම. |
| මාර්තු 15 | ජයනිගේ නිවසේ විදුලිබිල රු. 2 000ක් ගෙවීම. |
| මාර්තු 18 | ණයගැතියන්ගෙන් රු. 6 000 ක් ලැබීම. |
| මාර්තු 20 | ණයහිමියන්ට මුදල් ගෙව්වා රු. 5 000 කි. |
| මාර්තු 25 | බැංකු ණය ගැනීම් රු. 50 000 |

ඉහත එකිනෙක ගනුදෙනුවලින් සිදුවන බලපෑම මූලික ගිණුම්කරණ සමීකරණය යටතේ දක්වන්න. (පළමු ගනුදෙනුව නිදසුන් මගින් දක්වා ඇත.)

| දිනය | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| 3/1 | + 100 000<br>මුදල් | | + 100 000<br>ප්‍රාග්ධනය | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

28. පහත දැක්වෙන්නේ රසාලිත ව්‍යාපාරයේ 2022 ජනවාරි පළමු දිනට පැවති ගිණුම් ශේෂයන්ය.

| | |
|---|---|
| මුදල් | රු. 120 000 |
| බඩුතොගය | රු. 80 000 |
| ණයගැති | රු. 30 000 |
| ණයහිමි | රු. 30 000 |
| බැංකු ණය | රු. 60 000 |

ජනවාරි මාසයේ පහත ගනුදෙනු සිදුවිය.

1) රු. 20 000 ක් පිරිවැය වූ බඩුතොගයක් රු. 35 000කට ණයට විකිණීම.
2) ණයහිමියන්ට රු. 15 000 ක් මුදලින් ගෙව්වා.
3) අත්පිට මුදලට ගැණුම් රු. 14 000.
4) ව්‍යාපාරයේ විදුලි බිල රු. 6 200 ක් මුදලින් ගෙව්වා.
5) බැංකු ණය වාරිකය රු. 2 000 ක් ගෙව්වා එහි අඩංගු පොළිය රු. 500
6) රු.15 000 පිරිවැය වූ බඩු තොගයක් රු. 32 000ක මුදලට විකිණීම
7) අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 4 000යි.

ඔබ විසින්

I. 2021/01/01 දිනට හිමිකම ගණනය කරන්න.
II. ඉහත ගනුදෙනු මුදල්+බඩුතොගය+ණයගැති = හිමිකම+ණයහිමි+ බැංකු ණය යන සමීකරණයෙහි දක්වන්න.
III. මාසය අවසානයේ ව්‍යාපාරයේ ලාභය ගණනය කරන්න.
IV. 2021/01/31 දිනට
    I. ජංගම වත්කම්
    II. හිමිකම
    III. මුළු වගකීම්වල වටිනාකම ගණනය කරන්න.
V. මාසය අවසානයේ හිමිකමෙහි වෙනස්වීම කොපමණද?

29. පහත ගිණුම්කරණ සමීකරණවල සිදු වූ බලපෑමට අදාල වටිනාකම් සහිතව ගනුදෙනු ලියන්න.

| අනු අං. | වත්කම් | | | | හිමිකම් | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|
| | යන්ත්‍ර සූත්‍ර | බඩු තොග | මුදල් | ණයගැති | | ණයහිමි | බැංකු ණය |
| (1) | | | +100 000 | | +100 000 | | |
| (2) | +10 000 | | -10 000 | | | | |
| (3) | | +4 000 | -4 000 | | | | |
| (4) | | +5 000 | | | | +5 000 | |
| (5) | | -2 000 | +2 500 | | +500 | | |
| (6) | | -1 000 | | +2 000 | +1 000 | | |
| (7) | | | +25 000 | | | | +25 000 |
| (8) | | | -6 000 | | -6 000 | | |
| (9) | | | +7 500 | | +7 500 | | |
| (10) | | | -5 500 | | -500 | | -5 000 |

උදා- (1) අයිතිකරු විසින් යෙදූ ප්‍රාග්ධනය රු.100 000



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව